

# කණා කොකා හඬන සමුදුරු උයන්

නිවර්තන වැසි වානාන්තරයකට නොදෙවැනි ජෛව විවිධත්වයක් සහිත මිහිපිට ඇති එකම පරිසර පද්ධතිය කොරල් වේ. කොරල් යන වදන ඇසූ සැණින්ම අපේ මනසේ මැවෙන්නේ චමත්කාරජනක හැඩයන්ගෙන් යුත් සමුදුරු උයනකි. සාගර ජීවීන්ට මෙන්ම මිනිසාට ද ඉමහත් ප්‍රයෝජන සහිත කොරල්පර නිර්මාණය වී ඇත්තේ උණුසුම් පැහැදිළි, නොගැඹුරු ජලය සහිත නිවර්තන සහ උප නිවර්තන සාගරික ප්‍රදේශවල ය.

සුනිලා ජයන්ති බාලසූරිය

කොරල්පරවල ලෝක ව්‍යාප්තිය වර්ග කිලෝ මීටර හය ලක්‍ෂයක් පමණ වේ. පැසිපික් සාගරයේ සමහර දූපත් සම්පූර්ණයෙන් ම නිර්මාණය වී ඇත්තේ මැරුණු කොරල්වලිනි. ටියුබ් කොරල්, ඇඟිලි කොරල්, පන්ගස් කොරල්, රෝස කොරල්, මුහුදු පිහාටු වැනි කොරල්, මුහුදු අවාන් වැනි කොරල්, පඳුරු සහිත කොරල් යනාදී වශයෙන් කොරල් ප්‍රභේද විශාල ප්‍රමාණයක් ලොව පුරා ව්‍යාප්ත වී ඇත.

## කොරල් නිර්මාණය

පියවි ඇසට පෙනෙන ආකාරයට, කොරල් යනු අජීවී දෙයක් වුවත්, සත්‍යය නම් එය සජීවී දෙයක් වීම ය. එනම්, කොරල් නිර්මාණය වන්නේ සීලෙන්ටෙරාටා වංශයට අයත් බුහුබාවා නැතහොත් පොලිප් යන නමින් හඳුන්වන ඉතා කුඩා ජීවීන් සමූහයකිනි. මෙම ජීවීන් මිලි මීටර් 1 ක්(imm)තරම් කුඩා ප්‍රමාණයේ සිට අඟල් 8 ක් (8") දක්වා ප්‍රමාණයෙන් විවිධ වෙයි. එම කුඩා ප්‍රමාණයේ කොරල් ජීවීන් Zooxanthellate ගණයට අයත් වන අතර ඔවුහු ගණාවාස ලෙස ජීවත් වෙති. අති විශාල කොරල්පර සාදන්නේ මොවුන් ය. විශාල ප්‍රමාණයේ කොරල් ජීවීන් පර නොසාදන අතර හුදෙකලාව ජීවත් වීමට උත්සාහ ගනී. ඔවුන් Aqoozanthellate ගණයට අයත් වේ.

කොරල් පිළිබඳ අධ්‍යයනයෙහි යෙදෙන පර්යේෂකයන් පවසන පරිදි කොරල් ගණයට සින්ඩාරියා නමැති සත්ත්ව වංශයෙහි ඇක්නොසෝවා වර්ගයට අයත් කරඳිය අපෘෂ්ඨවංශී සත්ත්ව විශේෂයක් අයත් වේ.

බාහිරව හෝ අභ්‍යන්තරව දේහ සැකිල්ලක් ස්‍රාවය වී තිබීම ඔවුන් සතු විශේෂ ලක්ෂණයකි. එම දේහ සැකිල්ල කැල්සියම් කාබනේට්වලින් ( Ca Co 3) නිර්මාණය වී ඇත.

තවත් ලෙසකට කිවහොත් කොරල් බුහුබාවන් විසින් සිදු කරන ලිංගික ප්‍රජනනයෙන් මෙම ඉතා කුඩා ජීවීන් නිර්මාණය වන අතර ඔවුන් තනි තනිව සුදුසු ස්ථානවලට ගොස් කැල්සියම් කාබනේට්වලින් ගණාවාසයක් සාදා ගනී. මෙහි දී එක් එක් ජීවියා වෙන වෙනම කැල්සියම් කාබනේට්වලින් නිර්මිත කෝප්ප වැනි සැකිළි තනා ගනී. ඉන්පසු අලිංගික ප්‍රජනනය හරහා එවැනි අජීවී පිටපත් රැසක් නිපදවනු ලබයි.

කොරල් පරයක් නිර්මාණය වන්නේ එලෙස අති විශාල පිටපත් රැසක් වර්ධනය වීමෙනි. මෙලෙස නිර්මාණය වන කොරල් පරයක හැඩය තීරණය වන්නේ කෝප්ප හැඩැති (Co Co 3) සහිත ජීවී ඒකක එකිනෙක බැඳී පවතින ආකාරය අනුව ය.

කොරල් බුහුබාවන් විසින් සිදු කරන ලිංගික ප්‍රජනනයෙන් මෙම ඉතා කුඩා ජීවීන් නිර්මාණය වන අතර ඔවුන් තනි තනිව සුදුසු ස්ථානවලට ගොස් කැල්සියම් කාබනේට්වලින් ගණාවාසයක් සාදා ගනී. මෙහි දී එක් එක් ජීවියා වෙන වෙනම කැල්සියම් කාබනේට්වලින් නිර්මිත කෝප්ප වැනි සැකිළි තනා ගනී. ඉන්පසු අලිංගික ප්‍රජනනය හරහා එවැනි අජීවී පිටපත් රැසක් නිපදවනු ලබයි.



කෙසේ වෙතත් මෙවැනි කොරල් ආකෘතියක තැනීම සඳහා එක් කොරල්පරයක් තුළ ජීවත් වන කෝටි ගණනක් වූ කොරල් බුහුබාවනට ඔවුන් සමඟ සහජීවනයෙන් වෙසෙන ඇල්ගාවන්ගෙන් විශාල සහයෝගයක් ලැබේ. එනම්, කොරල් බුහුබාවාගේ සෛල තුළ සූසන්තෙලී නමැති ඇල්ගී විශේෂය ජීවත් වෙයි.

එම ඇල්ගී කොරල් බුහුබාවන් විසින් පිට කරන කාබන්ඩයොක්සයිඩ් (Co 2) ප්‍රයෝජනයට ගනිමින් ප්‍රභාසංස්ලේෂණය කර බුහුබාවන්ට අවශ්‍ය ඔක්සිජන් Co 2 සහ ආහාර ලබා දෙයි. මේ නිසා කොරල් පර වර්ධනය වීම සිදු වේ. එසේ කොරල් බුහුබාවන් සමඟ වෙසෙන ඇල්ගී වර්ගය අනුව කොරල් පරයේ වර්ණය සහ වර්ධන වේගය යන කරුණු තීරණය වේ.

මෙලෙස නිර්මාණය වන සමහර කොරල්වලට වර්ෂයකට සෙන්ටි මීටර 15 ක් පමණ (15 Cm) දිගින් වැඩීමේ හැකියාව ඇත. එහෙත් තාරකා කොරල්, මස්තිෂ්ක කොරල් වැනි සමහර විශේෂ වැඩෙන්නේ වර්ෂයකට අඟලකින් 1/8 සිට පමණ ඉතා සුළු වේගයකිනි.

**කොරල්වලින් නිර්මාණය කරනු ලබන ආභරණවලට ලොව බොහෝ රටවල වෙළඳපොළවල හොඳ ඉල්ලුමක් පවතී. විශේෂයෙන් හවායි දූපත්වාසීන් කොරල්වලින් අගනා ආභරණ නිපදවන අතර ඒවාට විදේශ වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් පවතී. එහි වෙසෙන්නන්ගෙන් 80% ක් පමණ මුහුදේ කිමිදී කොරල් ගළවා ඒවායින් මාල, තෝඩු, වළලු හා පැන්ඩන් තැනීම, කොරල් කැටයම් කිරීම, කරන අතර ඒවා විකිණීම මඟින් තම ජීවිකාව සරිකර ගනියි.**

## ව්‍යාප්තිය

මෙලෙස නිර්මාණය වන කොරල් සමකයේ සිට අංශක 30 ක් උතුරට හා දකුණට ව්‍යාප්ත වන කලාපයේ හොඳින් වර්ධනය වේ. එයට හේතුව කොරල්පරවල වර්ධනයට අවශ්‍ය සාධක සියල්ල ම මෙම කලාපයේ හොඳින් සංකේන්ද්‍රණය වී තිබීමයි. එනම්, පිරිසුදු ජලය, පැහැදිලි සූර්යාලෝකය, නියත ලවණ සාන්ද්‍රණය සහ සෙල්සියස් අංශක 20 ට (20.) වැඩි උෂ්ණත්වය යන කොරල් වර්ධනය හා ඒවායේ මනා පැවැත්මට අවැසි සාධක වඩාත් හොඳින් මෙම කලාපයේ සංකේන්ද්‍රණය වී ඇත. ඒ අනුව නිවර්තන කොරල්පර රටවල් 109 ක වෙරළ තීරවල දී දැකගත හැකිය. එහෙත් ඉහත සාධකවලින් පෙහොසත් නොවන ආක්ටික් වැනි සමහර සාගර ප්‍රදේශවල කොරල් නිර්මාණය නොවේ.

## වැදගත්කම

සමුද්‍රීය ජීවීන් රැසකට වාසස්ථාන සහ බෝ වීමේ ස්ථාන වශයෙන් ක්‍රියා කරයි.

කොරල් යනු සාගරික මත්ස්‍ය වර්ගයන්ගෙන් 1/3 වත් වැඩි සංඛ්‍යාවකට සහ පැළෑටි හා වෙනත් සත්ත්ව විශේෂ රැසකට මනා තෝතැන්නක් වන පරිසර පද්ධතියකි. දැනට ගණන් බලා ඇති අන්දමට මත්ස්‍ය වර්ග ඇතුළු සත්ත්ව විශේෂයන්ගෙන් 90% ක් පමණ සෘජුව හෝ වක්‍රව කොරල්පර මත යැපෙති. ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමේ දී මෙරට පවතින කොරල්පර ආශ්‍රිතව මත්ස්‍ය විශේෂ 300 ට අධික සංඛ්‍යාවක් වාසය කරන බව අනාවරණය වී ඇත. හික්කඩුව කොරල් උයනේ පමණක් මත්ස්‍ය විශේෂ 40 ක් පමණ දැකිය හැකිය. මෙරට ගාල්ල ප්‍රදේශයේ රූමස්සල කන්ද ආශ්‍රිතව ඇති බොනවිස්ටා කොරල්පරය ආශ්‍රිතව පනාවන් (Butterfly Fish)නමැති මත්ස්‍ය විශේෂ පමණක් 29 ක් හමු වෙයි. සමස්ත ලංකාව අවටින් ම එම මසුන් හමුවන්නේ විශේෂ 36 කි.

එමෙන්ම ලොව වටා පිහිටි කොරල්පර ආශ්‍රිතව පොකිරිස්සන්, කකුළුවන්, බෙල්ලන්, කවඩි, ස්පොන්ජ, ඉකිරි, ස්නැපර්, ගිරා මසුන්, ඒන්ජල්ස්, ගෝට් මසුන්, බැරකියුඩා, ආඳා, ගෝන්සු මාලුවා වැනි මත්ස්‍ය වර්ග බහුලව දැකිය හැකිය. මෙම මසුන්ගේ වාසයට මෙන්ම ඔවුන්ගේ බෝ වීමට ද සුදුසු පරිසරයකි කොරල්.

සතුන්ට අමතරව විවිධ පැළෑටි වර්ග ද කොරල් ආශ්‍රිතව දැකිය හැකිය.

## වෙරළ ඛාදනය අවම කරයි

ඈත මුහුදේ සිට වේගවත්ව ඇදී එන මුහුදු රළ පහරට බාධකයක් හෙවත් ස්වාභාවික දිය කඩනයක් ලෙස කොරල් ක්‍රියා කරයි. විශේෂයෙන් ගැටිපර නමැති කොරල්පර විශේෂය මෙහිදී මහඟු කාර්යයක් ඉටු කරයි. මේවා නිසා වෙරළ කරා එන රළ පහරේ වේගය අඩාල වී වෙරළ ඛාදනය අවම වීම සිදු වේ.

## විදේශ විනිමය ලබා දෙන සම්පතකි

කොරල්වලින් නිර්මාණය කරනු ලබන ආභරණවලට ලොව බොහෝ රටවල වෙළඳපොළවල හොඳ ඉල්ලුමක් පවතී. විශේෂයෙන් හවායි දූපත්වාසීන් කොරල්වලින් අගනා ආභරණ නිපදවන අතර ඒවාට විදේශ වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් පවතී. තව ද ඉතාලියේ විසූවියස් ගිනිකන්ද පාමුල පිහිටි එක් නගරයක් තවමත් හඳුන්වන්නේ "කොරල් ටවුන්" යනුවෙනි. එහි වෙසෙන්නන්ගෙන් 80% ක් පමණ මුහුදේ කිමිදී කොරල් ගළවා ඒවායින් මාල, තෝඩු, වළලු හා පැන්ඩන් තැනීම, කොරල් කැටයම් කිරීම, කරන අතර ඒවා විකිණීම මඟින් තම ජීවිකාව සරිකර ගනියි.

## සංචාරක ව්‍යාපාරයට යෝග්‍ය ස්ථාන වීම

ලොව වටා විශාල වශයෙන් සංචරණය වන සංචාරකයින් කොරල් උයන් සහිත ප්‍රදේශ සහ ඒ ආශ්‍රිතව වසන විසිතුරු මත්ස්‍යයන් නැරඹීමට දැඩි රුචියක් දක්වති. ශ්‍රී ලංකාවේ හික්කඩුව, පොල්හේන, අම්බලන්ගොඩ වැනි ස්ථාන සංචාරක පාරාදීසයන් බවට පත්ව ඇත්තේ එම ප්‍රදේශවල ඇති අසිරිමත් කොරල් උද්‍යානයන් නිසා ය.

## විවිධ පර්යේෂණ කටයුතු සඳහා මනා තෝතැනි වීම

කොරල්පර පිහිටි ප්‍රදේශ ජලජ සම්පත් පර්යේෂණවලට ඉතා වැදගත් වේ. ඔස්ට්‍රේලියාවේ මහා බාධක පරය මෙසේ පර්යේෂණයන්ට පාදක වන ප්‍රධානම කොරල් පරයයි. තවද ශ්‍රී ලංකාවේ හික්කඩුවේ පිහිටි කොරල් උයන ද, බොනවිස්ටා කොරල්පරය ද, බාර්ග් කොරල්පරය ද මෙලෙස පර්යේෂණවලට ලක්වන ස්ථානයන් ය. ඒ අතරින් ද බාර්ග් කොරල් පරය ඉතා වැදගත් වේ. එනම්, එය ගොඩබිමින් සැතපුම් 7ක් පමණ ඈත මුහුදේ පිහිටා තිබීමත්, ඒ හේතුවෙන් එය නැරඹීමට ඉඩ ලැබෙන්නේ පර්යේෂකයන්ට පමණක් වීමත් නිසා එය හුදෙක් පර්යේෂණ කලාපයක් පමණක් බවට පත්ව තිබේ.

## වෛද්‍ය විද්‍යාත්මකව වැදගත් වන ඖෂධ රැසක් සපයන ප්‍රභවයකි

බොහෝ කොරල්පර ආශ්‍රිත ජීව වස්තූන් තුළ ඉතා වටිනා ඖෂධ පදාර්ථ අඩංගු වේ. සමහර වර්ග පිළිකා රෝගය මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය ඖෂධ නිපදවීමට යොදාගත හැකි සංයෝග සහිත වේ. තවද කොරල්වල සැකිළි අස්ථි බද්ධ කිරීමේ දී ආදේශක වශයෙන් ද යොදා ගනී.

මීට අමතරව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය හුණු ලබා ගැනීම සඳහා ද කොරල් දායක වේ. එමෙන්ම වෙරළාසන්න ජනතාවට දෛනික ආදායමක් ද, ප්‍රෝටීන් ප්‍රභවයන් ද කොරල් මඟින් සැපයේ. තවද ධීවරයන් ට විවිධ මත්ස්‍ය වර්ග රැසක් ද, ඉස්සන් ද පහසුවෙන් සපයා ගත හැකි ස්ථාන වේ.

## කොරල්වලට එල්ල වී ඇති තර්ජන

මිනිසාට සහ සෙසු සත්ත්ව වර්ගයාට මහඟු ප්‍රයෝජන අත්කර දෙන කොරල් වර්තමානයේ මානව වර්ගයාගේ තර්ජනවලට බඳුන් වී ඇත. එනම්, ලොව දසත විසිරී සාගර ප්‍රදේශයන් හි පැතිරෙමින් ගොඩබිමට මුරකාවල් යොදන කොරල් පර, මානව සංහතියේ අධි පරිභෝජනයට ලක් වීම හා මානව ආත්මාර්ථකාමීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් මිහිමතින් තුරන් වෙමින් පවතී. මේ සඳහා බලපාන ප්‍රධාන හේතු ගණනාවකි.

* ධීවර බෝට්ටු කොරල්පර මත නැංගුරම් දැමීම
* හුණු නිෂ්පානදය සඳහා සීමා රහිතව කොරල් කැඩීම
* මසුන් මැරීම සඳහා විනාශකාරී ක්‍රම භාවිතය

උදා :- ඩයිනමයිට් දැමීම

* ධීවර කර්මාන්තයේ දී යොදා ගන්නා විවිධ පන්න ක්‍රම

උදා:- ඩිස්කෝ දැල් එළීම

මොක්හි දැල් භාවිතය

* නැව් ගමනා ගමනයේ දී මෝටර් බෝට්ටු ධාවනයේ දී අපවිත්‍ර තෙල් කොරල් මත පතිත වීම
* සුදුසු කළමනාකරණයකින් තොර සංචාරක කර්මාන්තය
* කෘෂිකාර්මික ජලය ගොඩබිම් ප්‍රදේශවල සිට මිරිදිය ජල මූලාශ්‍ර හරහා ගලා විත් කොරල් සහිත ප්‍රදේශවල පතිත වීම
* කැළිකසල කොරල් මත තැන්පත් වීම
* ගොඩබිම සිට රොන්මඩ ගලා විත් තැන්පත් වීම
* විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය, පළඳනා වර්ග, ඖෂධ ආදිය නිපදවීම සඳහා ප්‍රමාණය ඉක්මවා කොරල් කැඩීම
* සැලසුමකින් තොර සංවර්ධනය

ඉහත මානව බලපෑම්වලට අමතරව ස්වාභාවික සාධක කිහිපයක් ද කොරල්පරවල විනාශය සඳහා බලපායි

## ගෝලීය දේශගුණ වෙනස්වීම්

කලින් කල ඇතිවන එල්නිනෝ තත්ත්වයන් නිසා කොරල්පරවලට විශාල හානියක් සිදුවෙයි. එල්නිනෝ තත්ත්වයන් ඇති වන අවස්ථාවල දී ඉතා උණුසුම් දියවැල් නිර්මාණය වන අතර ඒවා කොරල් සහිත ප්‍රදේශවලට ඇදී ඒමෙන් කොරල් මරණයට පත් වී අජීවී සැකිලි බවට පත් වේ. 1998 වර්ෂයේ දී ඇති වූ එල්නිනෝ තත්ත්වය නිසා මෙරට හික්කඩුව කොරල් උයනේ පැවති කොරල්වලින් 90% ට වැඩි ප්‍රතිශතයක් අජීවී සැකිලි බවට පත්විය. එමෙන්ම ගාල්ලේ පිහිටි බොනවිස්ටා කොරල්පරය ආශ්‍රිතව 1998 ට පෙර ජීවී කොරල් විශේෂ 70% ට අධික ප්‍රමාණයක් තිබුණි. එහෙත් 1998 එල්නිනෝ බලපෑම නිසා එම ප්‍රමාණය 20% දක්වා අඩු විය.

## මාත්සය වර්ගවල බලපෑම

තාරකා මාලුන් (STAR FISH)නිසා ද කොරල් පරවල පැවැත්මට තර්ජන එල්ල වෙයි. මෙම මත්සයයන් කොරල්වල සිටින පොලිප් ජීවීන් උරා බීම නිසා කොරල් මරණයට පත් වන බව අනාවරණය වී ඇත. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ මෙම අහිතකර බලපෑම දැඩි ලෙස පවතී.

මෙලෙස විවිධ මානව හා ස්වාභාවික හේතු නිසා කොරල්පර විශාල වශයෙන් විනාශ වීම හේතුවෙන් කොරල් විශේෂ හා ඒ ආශ්‍රිත ජීවීන් විනාශ වීම සිදු වේ. මේ වන විට නිවර්තන කලාපයේ කොරල් හමුවන රටවල් අතරින් රටවල් 93 ක කොරල් පරවල සැළකිය යුතු හානියක් සිදුවී ඇත. දැනට කරන ලද අධ්‍යයනවලට අනුව ලෝකයේ ඇති කොරල්පර අතරින් 60% ක් මීළඟ දශක 3 ඇතුළත අහිමි වීමේ අවදානමක් පවතින බව අනාවරණය වී ඇත. තවද මෙලෙස කොරල්පර විනාශ වීම නිසා ඒ ආශ්‍රිත සමුද්‍ර ජීවීන්ට සිය වාසස්ථාන අහිමි වීම හේතුවෙන් ප්‍රජනනය සහ ගහන වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපායි. නිදසුනක් ලෙස හික්කඩුව කොරල් උයනේ විනාශයට පෙර පවුල් 23 කට අයත් මත්සය විශේෂ 55 ක් සිටි අතර Angel Fish Butterfly Fish, Wrasses Surgeon Fish යන විශේෂ ඒ අතර ප්‍රමුඛ විය. එහෙත් කොරල් අවපැහැ වූ පසු Butterfly Fish Wrassesයන විශේෂවල ගහණය ඉතා විශාල ලෙස අඩු වී ඇති බව අනාවරණය විය.

තවද, ඉවක් බවක් නැතිව කොරල් ඉවත් කිරීම නිසා වෙරළ ඛාදනය උග්‍ර වීමේ ගැටලුව ද වර්ධනය වෙමින් පවතී. එනම්, කොරල් කැඩීම නිසා ඈත මුහුදේ සිට වෙරළ කරා පැමිණෙන රළ පහරේ වේගය අඩු කිරීමට නොහැකි වීම තුළ වෙරළ ඛාදනය ශීඝ්‍රයෙන් සිදුවෙයි. 2005 දී ඇති වූ සුනාමි ව්‍යසනයෙන් දැඩි ලෙස හානියට පත් වූයේ මෙලෙස ප්‍රමාණය ඉක්මවා කොරල් විනාශ කළ හික්කඩුව, කහව, අම්බලන්ගොඩ වැනි ප්‍රදේශයන් ය.

මේ ආකාරයට විවිධ හේතු නිසා කොරල්පර විනාශ වීමත්, ඒ හේතුවෙන් මිනිසාට හා සෙසු සත්ත්ව ප්‍රජාවට අහිතකර බලපෑම් එල්ල වීමත්, රටක ප්‍රශ්න උග්‍ර කිරීම කෙරෙහි දැඩි ලෙස බලපායි. කෙසේ වෙතත් අනාගතයේ දී කොරල්පර නිර්මාණය වීමේ වේගය අඩු වීම පමණක් නොව, ඇතැම් ස්ථානවල කොරල්පර නිර්මාණය සම්පූර්ණයෙන් ම ඇණ හිටීම ද සිදුවනු ඇත. එවිට සොබාදම් මාතාව දුන් අගනා දායාදයක වියෝව නිසා මිනිසාට හඬා වැටීමට සිදුවනු ඇත. කොරල් නිසා රැකුණු දහස් ගණන් ජීවිත අවතැන් වනු ඇත.

සාගරය කුෂිත වී ගොඩබිම ගිලගනු ඇත. මේ සියල්ල සිදුවන තුරු ඇස් කන් නැතියවුන් සේ සිට, සියල්ල සිදුවීමෙන් පසු හඬා වැටීමෙන් පළක් නැත. එසේ නම් කළ යුත්තේ කොරල් විනාශය මැඩ පැවැත්වීම කෙරෙහි ලෝක ප්‍රජාව අත්වැල් බැඳ ගැනීමයි. විශේෂයෙන් පරිසර සංවිධානය පමණක් නොව, සෙසු සියලුම ජනතාව කොරල් රැක ගැනීම සඳහා දැඩි කැපවීමකින් කටයුතු කළහොත් මෙම අගනා සම්පත මතු පරපුරට ද දායාද කළ හැකි වනු ඇත. ❑

